**මුත්තූර් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මුත්තූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව්කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු. 377,000 කට මිලදීගත් ට්‍රැක්ටර් ටේලරය ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. එහෙයින් ජංගම නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ ලීබඩු සඳහා ගෙවා තිබූ රු. 493,845 ක් අත්තිකාරම් ගිණුමේ ගිණුම් ගත කර තිබුණි.

#### 1.3.3 ලැබියයුතු ගිණුම්
**------------------**

1984 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයතුල හිඟව තිබූ එකතුව රු. 12,638,221 ක්වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම හිඟ මුදලක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 32,900,660 | ඉඩම් හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,318,681 | ස්ථාවර වත්කම් ලේඛන |
| මොටර් වාහන | 28,916,570 | |
| ලීබඩු | 1,765,800 | |

### 1.3.5 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත වගන්තිය 134(1) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ජංගම නොවන දේපල හඳුනාගෙන එහි වටිනාකම් තක්සේරුකර වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 | මුදල් සහ ගබඩාව සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකීම් භාරදෙනලද නිලධාරින් හතර දෙනාගෙන් ආරක්ෂක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතියේ X වන පරිච්ඡේදයේ රීති 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ඇස්තමේන්තු සමඟ සසඳා විචලනයන් සඳහා හේතුන් ඇතුලත් ප්‍රකාශය සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | නැගෙනහිර පළාත් මූල්‍ය රීති අංක 237 | තිකුත් කර වර්ෂ දෙකක් ඉකුත් වී ඇතත් බැංකුවට ඉදිරිපත් නොකළ රු. 9,257 ක චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | මෝටර් රථ ප්‍රවාහන නීතියේ 203 වගන්තිය | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන 09 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම්වලින් රු. 3,128,510 ක පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් ලබා තිබූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් රු. 22,182,927 ක පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විස්තර | ඇස්තමේන්තු ගත ආදායම් | තත්‍ය ආදායම් | 2015 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 781,500 | 197,587 | 5,233,731 |
| බදුකුලි | 8,297,126 | 7,842,303 | 6,486,984 |
| සේවා සඳහා ගාස්තු | 8,385,000 | 1,418,544 | 6,976,510 |
| බදු ආදායම් | 750,000 | 630,500 | 309,491 |

### 2.2.2 මස් කඩ බදුකුලි ආදායම්

සමාලෝචිත වර්ෂයේ හිඟ මස්කඩ බදු කුලි ආදායම් රු. 2,701,919 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මොටර් වාහන 13 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් ධාවනට යොදවා තිබුණද ඒවා සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට 2011 වර්ෂයට පෙර සිට ගෙවියයුතුව තිබූ රු. 48,000 ක මුදල ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ සේවකයින් 07 දෙනෙකුට ගෙවා තිබූ ණය මුදලින් හිඟ ශේෂය රු. 133,242 ක් පසුගිය වර්ෂ 08 ක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන ජේදයේ 1.6 වගන්තිය අනුව ණය මුදලක් ලබාගත් නිලධාරියෙකු ස්ථාන මාරුවී යනවිට එම ණය විස්තර මාරු වී ගිය කාර්යාලයට යවා අයකර ගත යුතු වුවද, සේවකයින්ට ලබා දී තිබූ රු. 133,242 ක ණය මුදල ඉකුත් වර්ෂ 08 ක සිට අයකර ගැනීමට කටයුතු නොතිබුණි.

(ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පරිඝණක උපාංග සහ මෘදුකාංග සටහන් කිරීම සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 750 අනුව සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා තිබිය යුතුවූවත් සභාව විසින් ධාවනයේ යොදවා තිබූ වාහන 11 ක රාජ්‍ය ලාංඡන යොදා නොතිබුණි.

### 3.2 නිෂ්කාර්ය වත්කම්

--------------------

සභාව සතු ට්‍රැක්ටර් රථ හතරක් අළුත්වැඩියාකර පාවිච්චි කිරීමට කටයුතු නොකර වර්ෂ 03 සිට වර්ෂ 08 දක්වා වන කාලයක් නිෂ්කාර්යව තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක | 01 | - | 01 |
| සහායක | 29 | 26 | 03 |
| සුළු සේවක | 76 | 66 | 10 |

පසුගිය වසර 05 ට වැඩි කාලයක සිට කළමනාකරණ සේවා අධි ශ්‍රේණිය I තනතුරක් පුරප්පාඩුව් තිබුණි. එම පුරප්පාඩුව සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට කටයුතු නොකර වැඩ බැලීමේ පදනමින් එක් අයෙකු පත්කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරවනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) අයවැය පාලනය